# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# Performance Report

## 2020

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம்
நிதி அமைச்சு

Department of National Budget
Ministry of Finance

# 2020 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# ජාතික අයවැය දෙපාර්තමේන්තුව
# වැය ශීර්ෂ අංකය . 240

## පටුන


1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය....4

1.1 හැඳින්වීම ....4

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු....4

1.3 ප්‍රධාන කාර්යයන්....5

1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම....5

1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම....5

1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු....6

1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ....6

1.4 සංවිධාන සටහන....7

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම ....8

2.1 2020 වර්ෂයේ මුල් මාස 4 සඳහා වූ අතුරු සම්මත ගිණුම ....8

2.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ 2020 මාර්තු සිට මැයි අවසානය දක්වා වියදම් දැරීම සඳහා ජනාධිපතිතුමා විසින් අධිකාරිය ලබා දීම ....8

2.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ 2020 ජුනි සිට අගෝස්තු අවසානය දක්වා වියදම් දැරීම සඳහා ජනාධිපතිතුමා විසින් අධිකාරිය ලබා දීම ....9

2.4 2020 සැප්තැම්බර් 01 සිට 2020 විසර්ජන පනත සම්මත වනතුරු කාලය සඳහා වූ අතුරු සම්මත ගිණුම ....9

2.5 2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත ....9

2.6 අයවැය සංශෝධන 2020 ....10

2.6.1 පරිපූරක ඇස්තමේන්තු ....10

2.6.2 විශේෂ නීති සේවා බලපත්‍ර....10

2.7 විස්තරාත්මක කාර්ය සාධනය....10

2.8 අත්තිකාරම් ගිණුම් කටයුතු....17

2.9 රාජ්‍ය වියදම් කළමනාකරණය ....22

2.9.1 ප්‍රතිපාදන මාරු කිරීම ....22

2.9.2 පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ....22

2.9.3 රජයේ වියදම....22

3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)....24

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ....24

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය....25

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය....27

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් ........ 28
3.4.1 වාර්තා කිරීමේ පදනම ........ 28
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ ........ 29
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 29
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 30
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව ........ 30
**4 කාර්ය සාධන දර්ශක ........ 31**
4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2020 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ ........ 31
**5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ........ 32**
**6 මානව සම්පත් පැතිකඩ ........ 33**
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 33
6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය ........ 33
6.3 මානව සම්පත් සංවර්ධනය ........ 33
**7 අනුකූලතා වාර්තාව ........ 35**
**8 ඇමුණුම - i ........ 42**

# 1 ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

## 1.1 හැඳින්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තු පනත් වල ප්‍රතිපාදන යටතේ වන නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන සමස්ත මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම/වියදම් කළමණාකරණය සඳහා මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මෙම ක්‍රියාවලියේ දී රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ අදාළ මහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග නිරන්තර තොරතුරු විමසීම්හි නිරත වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

රාජ්‍ය මූල්‍ය සම්පත්ඵලදායී සහ කාර්යක්ෂම ලෙස වෙන්කිරීම හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය

### මෙහෙවර

පොදු භාණ්ඩ (Public goods) සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදාහැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීමෙන් රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කිරීම.

### අරමුණු

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

# 1.3 ප්‍රධාන කාර්යයන්

## 1.3.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර මධ්‍ය කාලීන අයවැය රාමුව (MTBF) නිමකිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීමේ චක්‍රලේඛය නිකුත් කිරීම
- වියදම් ඒකක සමග සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමග අයවැය සාකච්ඡා/ උපදේශක රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුද විමසා ආදායම, වියදම, මූල්‍යකරණ (දේශීය හා විදේශීය) හා ණය ගැනීම් සීමාවන් පිළිබඳව තීරණය කිරීම.
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පලකිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම සඳහා)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදයට සහභාගී වීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීමට සහභාගී වීම - කාරක සභා අවස්ථාවේ විවාදය
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

## 1.3.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදුකරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුළත්ව අදාල උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත අරමුදල් සීමාවන් තුළ ප්‍රකාශිත අරමුණු වෙනුවෙන්ම එම මුදල් යොදාගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා පාලන විධික්‍රම බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමග එක්ව කටයුතු කිරීම.
- ප්‍රතිපාදන වෙන් කිරීමේකාර්යක්ෂමතාවය අරමුණුකොට ගෙන ප්‍රමුඛතා අනුව ප්‍රතිපාදන නැවත වෙන් කිරීම (reallocation) හා මාරු කිරීම (Transfer)

- ජාතික අයවැයට අදාළ වන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරීක්ෂණ සැකසීම
- පාර්ලිමේන්තුවේ අනුකාරක සභාවන් වන රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA), රාජ්‍ය මුදල් කාරක සභාව (COPF) හා රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ (COPE) රැස්වීම් අවස්ථාවලදී භාණ්ඩාගාරය නියෝජනය කරමින් ඒවාට සහය දැක්වීම.
- පාර්ලිමේන්තු කාරක සභාවලදී සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවන රැස්වීම්වලදී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- ''පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්'' ව්‍යාපෘතිය (TMV) කළමනාකරණය කිරීම
- විශේෂ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (වාහන ලීසිං / පූලි වැඩ වර්ජක දීමනා /යතුරු පැදි ලබා දීම)

### 1.3.3 අත්තිකාරම් ගිණුම් කටයුතු


වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම්වල සීමා සංශෝධනය කිරීම.

### 1.3.4 අයවැය යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

- අයවැය යෝජනා විශ්ලේෂණය කර වඩාත් සුදුසු ආයතන වෙත අදාල ප්‍රතිපාදන නිකුත් කිරීම හා අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම

- අවශ්‍ය පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අදාල ආයතන සම්බන්ධීකරණය කිරීම.

## 1.4 සංවිධාන සටහන




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ.ජ. | - | අධ්‍යක්ෂ ජනරාල් | අති.අ.ජ. | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ගණකාධි | - | ගණකාධිකාරී |
| අ | - | අධ්‍යක්ෂ | නි.අ. | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | පරි.නි. | - | පරිපාලන නිලධාරී |
| ස.අ. | - | සහකාර අධ්‍යක්ෂ | කළ.සේ.නි. | - | කළමනාකරණ සේවා නිලධාරී | භා.ප. | - | භාෂා පරිවර්තක |
| තො.තා.නි. | - | තොරතුරු තාක්ෂණ නිලධාරී | ස.නි. | - | සංවර්ධන නිලධාරී | කා.කා.ස. | - | කාර්යාල කාර්යය සහයක |

# 2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ජනාධිපතිවරණය 2019 අවසාන භාගයේ පැවැත්වීම හේතුවෙන් සාම්ප්‍රදායිකව සිදුවන පරිදි 2020 වර්ෂයට අදාළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පෙර වර්ෂයේ දී සම්මත වී නොතිබීමත්, 2020 විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරගැනීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල පරිදි භාණ්ඩාගාර ලේකම්වරයාට ලබා දුන් අධිකාරී බලපත්‍ර අනුව වියදම් ඒකක වෙත ප්‍රතිපාදන ලබා දීමට 2020 වර්ෂය තුළ දෙවරක් කටයුතු කිරීමට සිදුවීමත්, නැවත අතුරු සම්මත ගිණුමක් යටතේ නව රජයේ අමාත්‍යාංශ ව්‍යුහයට අනුව ප්‍රතිපාදන වෙන් කිරීමත්, 2020 හා 2021 වර්ෂ සඳහා විසර්ජන පනත් කෙටුම්පත් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමට සිදු වීමත් හේතුවෙන් 2020 වර්ෂය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉතා කාර්යය බහුල හා අභියෝගාත්මක වසරක් විය.

## 2.1 2020 වර්ෂයේ මුල් මාස 4 සඳහා වූ අතුරු සම්මත ගිණුම

2019 වර්ෂයේ පැවති ජනාධිපතිවරණයෙන් පසු අමාත්‍යාංශ ව්‍යුහයේ සහ රජයේ ප්‍රතිපත්තිවල සිදුවීමට ඉඩ ඇති වෙනස්කම් සළකා බලා 2020 මූල්‍ය වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගන්නා තෙක් ඊට විකල්පයක් ලෙස 2020 වර්ෂයේ පළමු මාස හතර (04) වෙනුවෙන් වියදම් දැරීම සඳහා සකස් කළ අතුරු සම්මත ගිණුම 2019 වර්ෂයේ අවසානයේදී පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබී ය.

## 2.2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ 2020 මාර්තු සිට මැයි අවසානය දක්වා වියදම් දැරීම සඳහා ජනාධිපතිතුමා විසින් අධිකාරිය ලබා දීම

කෙසේ වුවද, 2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරගැනීමට පෙර 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද අතර රජයේ සේවාවන් හා සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එවකට මතුව තිබූ කොවිඩ් - 19 වසංගතය මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය වූ අත්‍යවශ්‍ය වියදම් දැරීම පිණිසත්, 2019 හා පෙර වසර වලට අදාල නොපියවූ බිල්පත් රු.බි. 242.7 ක් පියවීම සඳහාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව, 2020 මාර්තු 06 දින සිට මාස තුනක කාලයක් සඳහා ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාට බලය ලබාදෙන ලදී. ඒ අනුව වියදම් ඒකක වෙත ප්‍රතිපාදන සලසා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

## 2.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ 2020 ජුනි සිට අගෝස්තු අවසානය දක්වා වියදම් දැරීම සඳහා ජනාධිපතිතුමා විසින් අධිකාරිය ලබා දීම

කොවිඩ් - 19 වසංගත ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වූ ආරක්ෂිත පියවරයන්ට සමගාමීව පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමේ දිනය ද 2020 අගෝස්තු 05 ලෙස සංශෝධනය විය. එවකට පාර්ලිමේන්තුව විසුරුවාහැර තිබූ හෙයින් විසර්ජන පනත් කෙටුම්පතක් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කරගැනීමට නොහැකිවීම හේතුවෙන්, රජයේ සේවාවන් සහ සංවර්ධන කටයුතු සඳහා වන වියදම් දැරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව 2020 ජුනි 01 වන දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීම සඳහා නැවත වරක් භාණ්ඩාගාර ලේකම්වරයාට බලය ලබාදෙන ලදී. ඒ අනුව, එම මාස තුන (03) සඳහා වියදම් ඒකක වෙත නැවතත් ප්‍රතිපාදන සලසා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

## 2.4 2020 සැප්තැම්බර් 01 සිට 2020 විසර්ජන පනත සම්මත වනතුරු කාලය සඳහා වූ අතුරු සම්මත ගිණුම

2020 මහ මැතිවරණයෙන් පසුව නවවැනි පාර්ලිමේන්තු සැසිවාරය 2020 අගෝස්තු 20 වන දින කැඳවනු ලැබුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති කාල නියමයන් තුල විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අතිගරු ජනාධිපතිතුමන් විසින් බලය ලබාදීම කල් ඉකුත් වන 2020 සැප්තැම්බර් 01 දිනට පෙර පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගැනීම ප්‍රායෝගිකව අපහසු කරුණක් විය. එබැවින්, 2020 මහමැතිවරණයෙන් පසුව පිහිටුවන ලද නව රජයේ අමාත්‍යාංශ ව්‍යුහයට අනුව නැවත වරක් අතුරු සම්මත ගිණුමක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව 2020 සැප්තැම්බර් සිට 2020 විසර්ජන පනත සම්මත වනතුරු කාලය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන ලදී.

## 2.5 2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත

පසුව, ඉහත සඳහන් කරන ලද අතුරු සම්මත ගිණුම් දෙක යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව යටතේ ලබාදුන් අධිකාරී බලපත්‍ර දෙක යටතේ දරන ලද සියලුම වියදම් මෙන්ම විදේශීය මූල්‍යකරණ ප්‍රභවයන් උපයෝගී කරගෙන 2019 වර්ෂයේ දී වැයකරන ලද නමුත් ගිණුම්ගත නොකරන ලද ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා වන ප්‍රතිපාදන ද ඇතුළත් කරමින් 2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත සකස් කර 2020.10.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 2020.11.10 දින මෙම පනත් කෙටුම්පත, 2020 අංක 06 දරන විසර්ජන පනත ලෙස බලාත්මක විය.

## 2.6 අයවැය සංශෝධන 2020

පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් හෝ මුදල් අමාත්‍යවරයා විසින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීම මඟින් පාර්ලිමේන්තුව මඟින් සම්මත කරනු ලබන අයවැය සාමාන්‍යයෙන් සංශෝධනය වේ.

### 2.6.1 පරිපූරක ඇස්තමේන්තු

2020 වර්ෂය තුළ දී පරිපූරක ඇස්තමේන්තු කිසිවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැත.

### 2.6.2 විශේෂ නීති සේවා බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛනයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබාගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත. 2.6.2 වගුවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වන අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2020 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා විසින් රු.මිලියන 2.56 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා බලපත්‍ර 02ක් නිකුත් කර ඇත.

2.6.2 වගුව පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා බලපත්‍ර

| අංකය | වැය ශීර්ෂ අංකය | ආයතනය | කාර්යය/අරමුණ | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | 04 | ඉහළ අධිකරණවල විනිසුරුවන් | ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට අළුතින් පත් කරන ලද විනිසුරුවන්ට වැටුප් ගෙවීම සඳහා | 2,355,000 |
| 02 | 20 | මැතිවරණ කොමිෂම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය යටතේ කොමිෂන් සභාවට අළුතින් පත් කරන ලද සාමාජිකයින්ට වැටුප් ගෙවීම සඳහා | 205,000 |

## 2.7 විස්තරාත්මක කාර්ය සාධනය

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2020 වර්ෂයේ පළමු මාස හතර සඳහා වූ අතුරු සම්මත ගිණුම ක්‍රියාත්මක කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.<br>(2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සාමාන්‍යයෙන් සිදුවන පරිදි පෙර වර්ෂයේදී (2019) පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලද අතර 2019 වර්ෂයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම 2020 වර්ෂයේ පළමු මාස හතර තුළක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකරන ලදී.) | වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2020 ජනවාරි 1 වන දින සිට 2020 අප්‍රේල් 30 වන දින දක්වා වන කාලයට අදාළ වන වියදම් වෙනුවෙන් බලය දීම සඳහා අංක 09/2019 දරන 2019.12.31 දිනැති අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව ලබා දුන් අධිකාරිය යටතේ 2020 මාර්තු 06 දින සිට මාස තුනක කාලයක් සඳහා වියදම් ඒකක වෙත ප්‍රතිපාදන සැලසීම හා වියදම් කළමනාකරණය කිරීම.<br>(2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්මත කරගැනීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් රජයේ සේවාවන් හා සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව යටතේ ලබාදුන් අධිකාරී බලපත්‍රය යටතේ වියදම් ඒකක වෙත ප්‍රතිපාදන සලසන ලදී) | අදාල කාලය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම<br><br>අධිකාරී බලපත්‍ර සකස් කර ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම<br><br>ඉහත පරිදි වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2020 මාර්තු 6 වන දින සිට මාස තුනක කාලයක් දක්වා අදාළ වන වියදම් වෙනුවෙන් බලය දීම සඳහා 2020.03.10 දිනැති අංක 01/2020 දරන අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව ලබා දුන් අධිකාරිය යටතේ 2020 ජූනි 01 දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා කාලය සඳහා වියදම් ඒකක වෙත ප්‍රතිපාදන සැලසීම හා වියදම් කළමනාකරණය කිරීම.<br>(පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමේ දිනය ද සංශෝධනය කර තිබූ හෙයින් විසර්ජන පනත් කෙටුම්පතක් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කරගැනීමට නොහැකිවීම හේතුවෙන්, රජයේ සේවාවන් සහ සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව යටතේ ලබාදුන් අධිකාරී බලපත්‍රය යටතේ වියදම් ඒකක වෙත ප්‍රතිපාදන සලසන ලදී) | වියදම් කළමනාකරණය පිළිබඳඋපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම. | 2020 ජූනි මස 01 දින සිට 2020 අගෝස්තු 31 දින දක්වා අදාළ වන වියදම් වෙනුවෙන් බලය දීම සඳහා 2020.05.31 දිනැති අංක 03/2020 දරන අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 4. 2020 වර්ෂයේ සැප්තැම්බර් මස 01 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා අතුරු සම්මත ගිණුම සකස් කිරීම, අනුමත කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.<br><br>(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති කාල නියමයන් තුළ විසර්ජන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අතිගරු ජනාධිපතිතුමන් විසින් බලය ලබාදීම කල් ඉකුත් වන 2020 සැප්තැම්බර් 01 දිනට පෙර පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගැනීම ප්‍රායෝගිකව අපහසු වීම නිසා නව අමාත්‍ය මණ්ඩල ව්‍යුහයට අනුව අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමෙන් පසුව ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන ලදී) | 2020 වර්ෂයේ අවසන් මාස හතර සඳහා නව අමාත්‍යාංශ ව්‍යුහය යටතේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | ඒ වන තෙක් 2020 වර්ෂය සඳහා විසර්ජන පනතක් සම්මත වී නොතිබීම හේතුවෙන් රජයේ කාර්යයන් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වන ප්‍රතිපාදන ලබා දීම | අතුරු සම්මත ගිණුම 2020.08.17 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එයට 2020.08.19 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. |
| | අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | වියදම් සඳහා බලය දීම. | 2020.08.28 දින අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර එය එදිනම අනුමත කරන ලදී. |
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම. | වියදම් සඳහා බලය දීම. | 2020.08.31 දින ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී. |
| | වියදම් කළමනාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම. | වියදම් සඳහා බලය දීම. | අතුරු සම්මත ගිණුම මගින් අනුමත කරන ලද අයවැය ප්‍රතිපාදන යටතේ වියදම් දැරීම සඳහා අංක 04/2020 දරණ 2020.08.31 දිනැති අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 5. 2020 වර්ෂය සඳහා වන ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>(2020 වර්ෂය සඳහා වන විසර්ජන පනතක් නොතිබීම හේතුවෙන් අදාළ කාර්යයන් 2020 වර්ෂයේදී සිදුකරන ලදී.) | 2020 වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම් දෙක යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව යටතේ ලබාදුන් | 2020 වර්ෂය තුළ වැය දරන ආයතන වෙත එක් එක් කාල සීමාවන් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන සහ එක් එක් අමාත්‍යාංශයන්හි ප්‍රතිපාදන අවශ්‍යතාවයන් තව | 2020 සමස්ත වර්ෂය සඳහා අතුරු සම්මත ගිණුම් දෙක යටතේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) අනු ව්‍යවස්ථාව යටතේ ලබාදුන් අධිකාරී බලපත්‍ර දෙක යටතේ ප්‍රතිපාදන සලසා දී තිබූ අතර එක් එක් අමාත්‍යාංශයන්හි ප්‍රතිපාදන අවශ්‍යතාවයන් තව දුරටත් |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | අධිකාරී බලපත්‍ර දෙක යටතේ දරන ලද සියලුම වියදම් මෙන්ම විදේශීය මූල්‍යකරණ ප්‍රභවයන් උපයෝගී කරගෙන 2019 වර්ෂයේ දී වැයකරන ලද නමුත් ගිණුම්ගත නොකරන ලද ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා වන ප්‍රතිපාදන ද ඇතුළත් කරමින් 2020 වර්ෂය සඳහා වන විසර්ජන පනත සකස් කිරීම | දුරටත් සමාලෝචනය කර නව අමාත්‍යාංශ ව්‍යුහය යටතේ 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන බෙදා හැරීම | සමාලෝචනය කර නව අමාත්‍යාංශ ව්‍යුහයට අනුව ඇස්තමේන්තු සකස් කරන ලදී. |
| | 2020 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | 2020 නොවැම්බර් දෙවන සතියේ විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම | 2020 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2020.10.06 දින ගැසට් පත්‍රයේ පළ කිරීම.<br>විසර්ජන පනත් කෙටුම්පත 2020.10.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. |
| | | 2020 සවිස්තර ඇස්තමේන්තු සකස් කර මුද්‍රණය කිරීම. | 2020 සවිස්තර ඇස්තමේන්තු නියමිත දිනට මුද්‍රණය කිරීම. |
| | | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම. | විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීම 2020.11.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br>2020.11.12 දින පාර්ලිමේන්තුව මගින් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම.<br>2020 අංක 06 දරණ විසර්ජන පනත එදිනම ගරු කථානායකතුමා විසින් අත්සන යෙදීම. |
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් | වියදම් සඳහා බලය දීම. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2020.11.24 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | බලපත්‍ර නිකුත් කිරීම.<br><br>වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම. | | 2020 අංක 06 දරණ විසර්ජන පනත අනුව වියදම් දැරීම සඳහා බලය ලබා දීම සහ 2020 වසර සඳහා වියදම් වාර්තාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් අංක 06/2020 සහ 2020.11.30 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 6. 2020 අංක 06 දරණ විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය. | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මුරෙ 66 සහ මුරෙ 69 යටතේ අරමුදල් මාරු කිරීම සඳහා බලය ලබා දීම. | අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම. | එකී රෙගුලාසි අනුව ඉල්ලීම් 914 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 154 ක් වැඩසටහන් අතර මාරු කිරීම් සඳහා වන අතර 692 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් සඳහා වේ. මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 68 කට මුරෙ 69 යටතේ බලය ලබා දෙන ලදී. |
| | විසර්ජන පනතේ 6 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම. | වියදම් කිරීමේ ආයතන වල මනා ක්‍රියාකාරීත්වය පිණිස ඒවායේ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවන් ලබා දීම. | අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදාඃ කොවිඩ් 19 වසංගත තත්ත්වය) සහ වියදම් ඇස්තමේන්තුවල පැවති යම් යම් අපගමනයන් සපුරාලීම පිණිස වර්ෂය තුළදී පරිපූරක ප්‍රතිපාදන සඳහා වූ ලිපි 127 ක් වෙනුවෙන් රු. බිලියන 44.5 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. |
| | පරිපූරක ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව පරිපූරක ඇස්තමේන්තු මාස දෙකකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම. | ලබා දුන් සියලුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 02 ක් ඉදිරිපත් කරන ලදී. |
| 7. 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම) | සියළුම වියදම් කිරීමේ ආයතන මගින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම. | 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් වූ අංක 05/2020 දරන චක්‍රලේඛය 2020.09.03 දින නිකුත් කරන ලදී |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමග සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සැකසීම. | රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ශවකරුවන් සමඟ පූර්ව අයවැය සාකච්ඡා පවත්වන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම. | වියදම් ප්‍රමුඛතා ගත කරමින් නිසි මූල්‍ය කළමනාකරණයක් හා මූල්‍ය විනයක් සහිතව අදාළ මූල්‍ය ඉලක්ක ළඟා කර ගත හැකි පරිදි අයවැයක් සකස් කිරීම | භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් සමඟ සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |
| | 2021 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2021 වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2020.10.06 දින ගැසට් පත්‍රයේ පළ කිරීම<br><br>විසර්ජන පනත් කෙටුම්පත 2020.10.20 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. |
| | | 2021 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු මුද්‍රණය කිරීම සහ සවිස්තර ඇස්තමේන්තු සකස් කිරීම. | 2021 කාර්යයන් අනුව සකස් කරන ලද අයවැය ඇස්තමේන්තු නියමිත දිනට මුද්‍රණය කිරීම හා සවිස්තර ඇස්තමේන්තු සකස් කිරීම. |
| | | විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම. | 2020.11.17 දින අයවැය කතාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (දෙවන වර කියවීම).<br><br>2020.11.18 සිට 2020.12.10 දක්වා අයවැය විවාදය පැවැත්වීම<br><br>2020.12.10 දින පාර්ලිමේන්තුව මගින් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම.<br><br>2020 අංක 07 දරන විසර්ජන පනත 2020.12.10 දින ගරු කථානායකතුමා විසින් සහතික කිරීම. |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම.<br><br>වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් බලය ලබා දීමේ චක්‍රලේඛය නිකුත් කිරීම. | වියදම් සඳහා බලය ලබා දීම. | ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2020.12.17 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.<br><br>2021 වියදම් දැරීම සඳහා බලය ලබා දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් අංක 07/2020 සහ 2020.12.28 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 8. ජාතික අයවැය දෙපාර්මේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය | පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීම<br><br>(අ) මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ වියදම් සමාලෝචනය පරිච්ඡේදය<br><br>(ආ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br><br>(ඇ)විසර්ජන ගිණුම<br><br>(ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම | නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම | පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී<br><br>(අ) වියදම් සමාලෝචනය 2020<br><br>(ආ) කාර්ය සාධන වාර්තාව<br><br>(ඇ) විසර්ජන ගිණුම 2020<br><br>(ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම 2020 |
| | හැකියා වර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය | විදේශීය ආයතන විසින් දායකත්වය සපයන ලද අන්තර්ජාලය ඔස්සේ පැවත්වූ විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් දෙදෙනෙකු සහභාගි වී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා අදාල වන පරිදි නිලධාරීන්ට දේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත |

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම | අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවෙකුටම ණය අත්තිකාරම් ප්‍රදානය කිරීම | බලය ලබාදී ඇති සීමාවන් පිළිපදිමින් රු 6,394,558ක් වටිනා ආපදා ණය පාපැදි ණය විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිකාරම් ලබාදී ඇත |
| | විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම<br><br>පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පිළිබද කාරක සභාව ගිණුම් කාරක සභාව රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාව නියෝජනය කිරීම | විගණන විමසුම් අවම කිරීම | විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් එවන ලද සියළුම විගණන විමසුම් (විගණන විමසුම් පහකට 05) සඳහා පිළිතුරු ලබාදෙන ලදී |
| 9 විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝක බැංකුව ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැලසීම | අවශ්‍ය අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමග සාකච්ඡාවලට සහභාගි වීම | සංවර්ධන පාර්ශවකරුවන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීම | අදාල අවස්ථාවල දී සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම සඳහා භෞතිකව හෝ මාර්ගගතව සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කිරීම |

## 2.8 අත්තිකාරම් ගිණුම් කටයුතු

2020 වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතු වලට අදාළ සත්‍ය වියදම රු.බිලියන 16.0 ක් වූ අතර ඇස්තමේන්තුගත උපරිම වියදම රු.බිලියන 19.8 ක් විය. රු.බිලියන 14.8 ක් වූ ඇස්තමේන්තුගත අවම ලැබීම් ප්‍රමාණය හා සැසඳීමේදී සත්‍ය මුළු ලැබීම් ප්‍රමාණය රු.බිලියන 16.5 ක් විය. ඒ අනුව, 2020 අංක 06 දරණ විසර්ජන පනතේ අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදු කර ඇත. වාණිජමය ස්වභාවයේ කටයුතු සහ දේපළ ණය හැර රජයේ සේවකයින් සඳහා වන අනෙකුත් අත්තිකාරම්, අත්තිකාරම් ගිණුම යටතේ වන කටයුතු වලට ඇතුළත් වේ.

කොවිඩ් 19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා රජය විසින් රට අගුලුලෑමට සමගාමීව රජයේ සේවකයන් සඳහා වාර්ෂිකව ලබාදෙන උත්සව අත්තිකාරම් ද 2020 වර්ෂය සඳහා ලබා නොදීමට රජය තීරණය කරන ලදී. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020, 2020.03.26 දිනැතිව නිකුත් කරන ලදී. ඒ හේතුවෙන් 2019 වර්ෂය හා සැසඳීමේ දී අත්තිකාරම් ගිණුම් වල යම් පසුබෑමක් පෙන්නුම් කරයි.

2019 වර්ෂයේ දී රු. බිලියන 26.1 ක් වූ අත්තිකාරම් ගිණුම් කටයුතු වල වියදම 2020 වර්ෂයේ දී 38% කින් පහත වැටී ඇත. ඊට සමගාමීව 2019 වර්ෂයේ දී රු. බිලියන 24.4 ක් වූ එම කටයුතු වලින් ලැබීම් 2020 වර්ෂයේ දී 32% කින් අඩුවී ඇත.

2020 විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් ඒකකයන් ද ඇතුළුව අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කළ ආයතන 58 ක් සඳහා යෝජිත සීමාවන් සංශෝධනය කිරීම් පහත පරිදි වේ.

| අනුක්‍රමික අංකය | අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව | විෂයය අංකය | රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව (රු) | | රජයේ කටයුතු පිළිබඳ ගිණුම් වලට බැර කළ යුතු ලැබීම් වල අවම සීමාව (රු) | | රජයේ කටයුතු වල හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු*) | | ශ්‍රේණි අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | ධක්වා | |
| 1 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 00601 | - | - | - | - | 30,000,000 | 38,000,000 | 1 |
| 2 | පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය | 01701 | - | - | 2,000,000 | 1,100,000 | - | - | 2 |
| 3 | මැතිවරණ කොමිෂන් සභාව | 02001 | - | - | - | - | 85,000,000 | 115,000,000 | 3 |
| 4 | විගණන සේවා කොමිෂන් සභාව | 02301 | - | - | 1,600,000 | 600,000 | 4,000,000 | 6,000,000 | 4 |
| 5 | බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා | 10101 | - | - | 31,000,000 | 8,000,000 | - | - | 5 |
| 6 | ආරක්ෂක අමාත්‍යවරයා | 10301 | 38,500,000 | 75,000,000 | - | - | - | - | 6 |
| 7 | විදේශ අමාත්‍යවරයා | 11201 | - | - | - | - | 120,000,000 | 124,000,000 | 7 |
| 8 | බලශක්ති අමාත්‍යවරයා | 11501 | - | - | 2,500,000 | 2,400,000 | - | - | 8 |
| 9 | කෘෂිකර්ම අමාත්‍යවරයා | 11801 | - | - | 33,000,000 | 29,000,000 | - | - | 9 |
| 10 | ඉඩම් අමාත්‍යවරයා | 12201 | - | - | 12,500,000 | 9,000,000 | - | - | 10 |
| 11 | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා | 12301 | 7,100,000 | 37,000,000 | - | - | - | - | 11 |
| 12 | අධ්‍යාපන අමාත්‍යවරයා | 12601 | - | - | - | - | 2,540,000,000 | 3,100,000,000 | 12 |
| 13 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා | 13001 | - | - | 28,500,000 | 22,000,000 | - | - | 13 |
| 14 | වැවිලි අමාත්‍යවරයා | 13501 | - | - | 14,500,000 | 5,820,000 | - | - | 14 |
| 15 | ධීවර අමාත්‍යවරයා | 15101 | - | - | 4,000,000 | 2,100,000 | - | - | 15 |
| 16 | වරාය හා නාවික අමාත්‍යවරයා | 17601 | - | - | - | - | 18,000,000 | 18,600,000 | 16 |
| 17 | කම්කරු අමාත්‍යවරයා | 19301 | - | - | - | - | 52,000,000 | 55,600,000 | 17 |

| අනුක්‍රමික අංකය | අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව | විෂයය අංකය | රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව (රු) | | රජයේ කටයුතු පිළිබඳ ගිණුම් වලට බැර කළ යුතු ලැබීම් වල අවම සීමාව (රු) | | රජයේ කටයුතු වල හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු*) | | ශීර්ෂ අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | ධක්වා | |
| 18 | තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා | 19401 | - | - | 21,500,000 | 14,300,000 | - | - | 18 |
| 19 | වාරිමාර්ග අමාත්‍යවරයා | 19801 | - | - | 4,400,000 | 2,500,000 | 40,000,000 | 50,000,000 | 19 |
| 20 | ජාතික උරුම ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 40101 | - | - | 1,200,000 | 500,000 | - | - | 20 |
| 21 | කාන්තා හා ළමා සංවර්ධන පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යවරයා | 40301 | - | - | 28,000,000 | 14,500,000 | - | - | 21 |
| 22 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40401 | - | - | 1,500,000 | 0.00 | | | 22 |
| 23 | විසිතුරු මසුන් මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම ධීවර වරාය සංවර්ධන බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යවරයා | 40501 | - | - | 950,000 | 86,000 | - | - | 23 |
| 24 | සූර්ය බල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40601 | - | - | 1,200,000 | 266,000 | - | - | 24 |
| 25 | වේවැල් පිත්තල මැටි ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 40801 | - | - | 23,500,000 | 3,800,000 | - | - | 25 |
| 26 | අභ්‍යන්තර ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 40901 | 52,300,000 | 551,000,000 | - | - | - | - | 26 |
| 27 | සමාගම් වතු ප්‍රතිසංස්කරණ තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 41001 | - | - | 2,000,000 | 74,000 | - | - | 27 |
| 28 | නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 41101 | - | - | 4,200,000 | 3,900,000 | - | - | 28 |
| 29 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 41201 | - | - | 26,500,000 | 13,000,000 | 50,000,000 | 64,000,000 | 29 |
| 30 | සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 41401 | 4,400,000 | 5,600,000 | - | - | - | - | 30 |

| අනුක්‍රමික අංකය | අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව | විෂයය අංකය | රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව (රු) | | රජයේ කටයුතු පිළිබඳ ගිණුම් වලට බැර කළ යුතු ලැබීම් වල අවම සීමාව (රු) | | රජයේ කටයුතු වල හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු*) | | ශීර්ෂ අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | ධක්වා | |
| 31 | දේශීය වෙදකම් ප්‍රවර්ධන ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයා | 41601 | - | - | 10,000,000 | 4,200,000. | - | - | 31 |
| 32 | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | 41701 | - | - | 7,200,000 | 7,126,989.02 | - | - | 32 |
| 33 | කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා | 41901 | - | - | 500,000 | 350,000.00 | - | - | 33 |
| 34 | නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරයා | 42101 | - | - | 18,000,000 | 16,000,000 | - | - | 34 |
| 35 | දහම් පාසැල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යවරයා | 42201 | 5,600,000 | 30,000,000 | - | - | - | - | 35 |
| 36 | ඖෂධ නිෂ්පාදන සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | 42301 | - | - | 4,000,000 | 2,750,000 | - | - | 36 |
| 37 | වනජීවී රැකවරණය අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42401 | - | - | 1,200,000 | 65,000 | - | - | 37 |
| 38 | වී හා ධාන්‍ය කාබනික ආහාර එළවළු පළතුරු මිරිස් ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා | 42501 | - | - | 2,200,000 | 20,000 | - | - | 38 |
| 39 | පොහොර නිෂ්පාදන හා සැපයුම් රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යවරයා | 42601 | - | - | 9,500,000 | 200,000 | - | - | 39 |
| 40 | පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 42701 | - | - | 12,200,000 | 9,500,000 | - | - | 40 |
| 41 | මහවැලි කළාප ආශ්‍රිත ඇළ වේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42801 | - | - | 1,000,000 | 400,000 | - | - | 41 |
| 42 | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 42901 | - | - | 1,500,000 | 205,000 | - | - | 42 |
| 43 | ඉඩම් කළමනාකරණ කටයුතු රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන | 43001 | - | - | 1,000,000 | 120,000 | - | - | 43 |

| අනුක්‍රමික අංකය | අමාත්‍යංශය/දෙපාර්තමේන්තුව | විෂයය අංකය | රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව (රු) | | රජයේ කටයුතු පිළිබඳ ගිණුම් වලට බැර කළ යුතු ලැබීම් වල අවම සීමාව (රු) | | රජයේ කටයුතු වල හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු*) | | ශීර්ෂ අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | ධක්වා | |
| | රාජ්‍ය අමාත්‍යවරයා | | | | | | | | |
| 44 | පොල් කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා | 43101 | - | - | 1,500,000 | 70,000 | - | - | 44 |
| 45 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43301 | - | - | 850,000 | 50,000 | - | - | 45 |
| 46 | ගුදම් පහසුකම් බහාලුම් අංගන වරාය සැපයුම් පහසුකම් සහ බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43401 | - | - | 1,200,000 | 35,000 | - | - | 46 |
| 47 | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යවරයා | 43501 | - | - | 1,000,000 | 200,000 | - | - | 47 |
| 48 | වාහන නියාමනය බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 43601 | - | - | 1,500,000 | 80,000 | - | - | 48 |
| 49 | ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා | 43701 | - | - | 1,200,000 | 100,000 | - | - | 49 |
| 50 | සමූපකාර සේවා අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා | 43801 | - | - | 2,500,000 | 2,000,000 | - | - | 50 |
| 51 | බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයා | 43901 | - | - | 1,200,000 | 100,000 | - | - | 51 |
| 52 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා | 44001 | - | - | 850,000 | 45,000 | - | - | 52 |
| 53 | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | 20901 | - | - | 3,600,000 | 3,100,000 | - | - | 53 |
| 54 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 21601 | - | - | 13,400,000 | 12,500,000 | - | - | 54 |
| 55 | නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව | 23501 | - | - | 700,000 | 472,256 | - | - | 55 |
| 56 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කුරුණෑගල | 27201 | 80,000,000 | 85,000,000 | - | - | - | - | 56 |
| 57 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මොණරාගල | 27701 | 30,000,000 | 30,580,000 | - | - | - | - | 57 |
| 58 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | 33101 | - | - | 47,300,000 | 42,500,000 | - | - | 58 |

# 2.9 රාජ්‍ය වියදම් කළමනාකරණය

## 2.9.1 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුල මුදල් රෙගුලාසි වල සඳහන් වීරමොං පටිපාටිය යටතේ, උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට විසර්ජන පනතේ 5 වන වගන්තිය මගින් ආයතනයන්ට අවසර ලබා දී ඇත. ඒ අනුව 2020 වර්ෂය තුලදී රු.මිලියන 84,620 ක වටිනාකමින් යුතු එවැනි මාරු කිරීම් 914 ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත .

## 2.9.2 පරිපූරක සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්

වැය දරන ආයතනයන් හි පුරෝකථනය කළ නොහැකි හදිසි හා අනපේක්ෂිත අරමුදල් අවශ්‍යතා සඳහා 2020 මුද්‍රිත අයවැය ඇස්තමේන්තු වල දක්වා ඇති විශේෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව අතිරේක ප්‍රතිපාදන ලබාදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් 2020 වර්ෂයේදී ද වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සභාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, 2020 වර්ෂයේ දී විවිධ වියදම් ඒකක සඳහා රු.බි 44.9 ක අතිරේක ප්‍රතිපාදන ලබාදී ඇත .

2020 අංක 06 දරන විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් එසේ ලබා දුන් අතිරේක ප්‍රතිපාදන සම්බන්ධව වාර්තා වරින් වර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. 2020 වර්ෂයට අදාළව මෙවැනි වාර්තා 2 ක් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. ඊට අමතරව 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය (වගකීම්) කළමනාකරණ පනතට අනුව එම අතිරේක ප්‍රතිපාදන ලබාදීම් පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ ද ඉදිරිපත් කරන ලදී.

## 2.9.3 රජයේ වියදම

ණය ආපසු ගෙවීම්ද ඇතුලත්ව 2020 වර්ෂය තුල සමස්ථ රජයේ වියදම රු.බි. 4,456 ක් වාර්තා වී ඇති අතර 2019 වර්ෂයේ රු.බි. 4,076 ක් වු අගය හා සැසඳීමේදී සියයට 9.3 ක් එනම් නාමික අගය සැලකූ විට රු.බි. 380 ක වැඩිවීමකි.

රජයේ මුළු වියදමින් සියයට 60.2 ක් එනම් රු.බි 2,683 ක් පුනරාවර්තන වියදම් වේ. 2019 වර්ෂයේ දී මුළු පුනරාවර්තන වියදම වූ රු.බි 2,322 ක් හා සැසඳීමේදී 2020 වර්ෂය තුල සියයට 15.5 කින් වැඩිවී ඇත. 2020 වර්ෂයේ මුළු මූලධන වියදම රු.බි. 1,774 ක් වන අතර එය 2019 වර්ෂයේ වූ රු.බි. 1,754 හා සැසඳීමේදී සියයට 1.14 ක වර්ධනයකි. මේ අතර 2019 වර්ෂයේ දී සියයට 75 ක් ව පැවති රජයේ මූලධන වියදම් වල උපයෝජන අනුපාතය 2020 දී සියයට 93 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත.

2020 වර්ෂයේ දී විශේෂ නීති යටතේ වු ඇස්තමේන්තු ගත වියදම (විසර්ජන පනතේ දෙවන උපලේඛනයේ මූල්‍යකරණ කේත 21 ) රු.බි. 2,000 ක් වුවද සත්‍ය වියදම රු.බි. 1,949 ක් ලෙස වාර්තා විය.

**2.9 වගුව : වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම**

| පුනරාවර්තන වියදම | රුපියල් බිලියන* | පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය | සමස්ත වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | 2,683 | 100 | 60 |
| මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි | 579 | 22 | 13 |
| ගමන් වියදම් | 15 | 1 | 0 |
| සැපයුම් | 143 | 5 | 3 |
| නඩත්තු වියදම | 7 | 0 | 0 |
| සේවාවන් | 56 | 2 | 1 |
| මාරුකිරීම් ( පළාත් සභා සහ රාජ්‍ය ආයතන වලට මාරුකිරීමද ඇතුළත්ව) | 881 | 33 | 20 |
| පොළී ගෙවීම් සහ වට්ටම් | 975 | 36 | 22 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 26 | 1 | 1 |
| **මූලධන වියදම** | **රුපියල් බිලියන*** | **මූලධන වියදමේ ප්‍රතිශතය** | **සමස්ත වියදමේ ප්‍රතිශතය** |
| මුළු මූලධන වියදම | 1,774 | 100 | 40 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 21 | 1 | 0 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 142 | 8 | 3 |
| මූලධන මාරු කිරීම් | 184 | 10 | 4 |
| මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 69 | 4 | 2 |
| හැකියා ප්‍රවර්ධනය | 3 | 0 | 0 |
| වෙනත් මූලධන වියදම | 393 | 22 | 9 |
| රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම | 962 | 54 | 22 |
| සමස්ත වියදම | 4,456 | | 100 |

* මෙම වියදම ආසන්න රුපියල් බිලියනයට වටයා ඇත.

# 3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව)

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ- එෆ්

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු .

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | අන්තර් ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 509,454 | 6,793,535 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **509,454** | **6,793,535** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 2,386,322,000 | 5,997,403,325 | ඒසීඒ-3 ඒසීඒ-4 |
| - | තැන්පතු | | 26,668,135 | 66,788,779 | |
| - | අත්තිකාරම් ගිණුම් | | 14,383,959 | 10,991,606 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 198,483,733 | 115,132,025 | |
| - | **මුළු ආදායම් නොවනලැබීම් (ආ)** | | **2,625,857,827** | **6,190,315,735** | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් = (අ)+ (ආ)** | | **2,626,367,281** | **6,197,109,270** | |
| | **අඩු කළා් වියදම** | | | | |
| | **පුනරාවර්තන වියදම** | | - | - | |
| 107,000,000 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 105,977,054 | 99,484,154 | |
| 153,567,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 150,087,999 | 605,683,285 | ඒසීඒ-2(ii) |
| 28,115,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 22,259,019 | 33,520,361 | |
| - | පොළී ගෙවීම් | 8 | | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 25,155,028,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 25,797,464,837 | - | |
| 25,443,710,000 | **මුළු පුනරාවර්තන වියදම්** | | **26,075,788,909** | **738,687,800** | |
| | **මූලධන වියදම්** | | | | |
| 800,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණුකිරීම | 10 | 782,674 | 629,148 | **ඒසීඒ-2(ii)** |
| 2,126,258,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 2,136,989,726 | 5,324,979,279 | |
| - | ප්‍රාග්ධන පැවරීම | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 152,200 | 3,111,757 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| 2,128,058,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **2,137,924,600** | **5,328,720,184** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **206,151,678** | **127,240,264** | |
| | **තැන්පතු ගෙවීම්** | | 193,325,103 | 116,859,279 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 12,826,575 | 10,380,984 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම උ = (ඇ +ඉ +ඊ)** | | 28,419,865,187 | 6,194,648,248 | |
| - | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ -උ )** | | **(25,793,497,906)** | **2,461,022** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ- පී**

### 2020 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2020** | **2019** |
| | _ - | රු. | රු. |
| <u>**මූල්‍ය නොවන වත්කම්**</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **ඒසීඒ-6** | 4,334,593,809 | 21,737,380,974 |

| | | | |
|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | **ඒසීඒ- 5/5 (ඒ)** | 24,914,348 | 26,471,732 |
| මුදල් හා මුදල් සමාන දෑ | **ඒසීඒ-3** | - | 635,608 |
| **මුළු වත්කම්** | | **4,359,508,157** | **21,764,488,314** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 14,037,076, | (151,062,508) |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 4,334,593,809 | 21,737,380,974 |
| කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය | **ඒසීඒ- 5 (බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | **ඒසීඒ-4** | 10,877,272 | 177,534,240 |
| අග්‍රිම ශේෂය | **ඒසීඒ-3** | - | 635,608 |
| **මුළු වගකීම්** | | **4,359,508,157** | **21,764,488,314** |

පිටු අංක ....6..... සිට ....57.... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ....58.... සිට .....65.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................... | ................... | ................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : එස්. ආර්. ආටිගල | නම : ජුඩ් නිලුක්ෂාන් | නම : ජී.ඩී.එම්. මුදිතා ගුණරත්න |
| තනතුර : ලේකම් මුදල් අමාත්‍යාංශය | තනතුර : අධ්‍යක්ෂ ජනරාල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව | ජාතික අයවැය දෙපාර්තමේන්තුව |
| දිනය : 2021.05.31 | දිනය : 2021.05.31 | දිනය : 2021.05.31 |
| එස්. ආර්. ආටිගල<br>මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ<br>මුදල් අමාත්‍යාංශය<br>මහලේකම් කාර්යාලය | ජුඩ් නිලුක්ෂාන්<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය | ජී.ඩී.එම්. මුදිතා ගුණරත්න<br>ගණකාධිකාරී<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය<br>කොළඹ 01 |

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-සී**

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | තත්‍ය 2020 (රු.) | 2019 (රු.) |
|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන්</u>** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 198,482,133 | 121,925,560 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | 509,454 | - |
| අග්‍රිම ලැබීම් | 2,386,322,000 | 5,997,403,325 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **2,585,313,587** | **6,119,328,885** |
| **<u>අඩු කළා- මුදල් වැය කිරීම:</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 255,971,403 | 704,971,889 |
| සහනාධාර සහ මාරු කිරීම් වියදම් | 22,259,019 | 33,520,361 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 1,081,237 | 1,991,981 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 347,871 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **279,659,530** | **740,484,231** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ) -(ආ )** | **2,305,654,057** | **5,378,844,654** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 1,600 | - |
| උපකරණ ණය අයකර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 5,320,469 | 9,817,185 |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)</u>** | **5,322,069** | **9,817,185** |
| **<u>අඩු කළා- මුදල් වැය කිරීම</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම් | 2,137,924,600 | 5,328,720,185 |
| අත්තිකාරම් ගෙවීම් | 6,394,558 | 9,871,154 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,144,319,158** | **5,338,591,339** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඈ) -(ඉ)** | **(2,138,997,089)** | **(5,328,774,154)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඈ)+ (ඊ)** | **166,656,968** | **(50,070,500)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 26,668,135 | 66,788,779 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **26,668,135** | **66,788,779** |
| **අඩු කළා- මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | - | - |
| තැන්පතු ගෙවීම | 193,325,103 | 116,859,279 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **193,325,103** | **116,859,279** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඒ)= (ඌ) -(එ)** | **(166,656,968)** | **(50,070,500)** |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ)= (උ)- (ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

# 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.4.1 වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසලකා මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මිනුම් කිරීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5) දේපළ පිරියත හා උපකරණ සංචිත**

මෙම සංචිත ගිණුම දේපළ පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) මුදල් සහ මුදල් හා සමාන වෙනත් දේ**

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 25,443,710,000 | 36,908,616,074 | 26,075,788,909 | 71 |
| **ප්‍රාග්ධන** | 2,128,058,000 | 2,137,941,926 | 2,137,924,600 | 100 |

## 3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය | 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තා අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණ යට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 104,916 | 104,916 | | 100 |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | 4,229,677 | 4,229,677 | - | 100 |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2020 වර්ෂය තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විමසුම් පහක් (05) ක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඒ සියල්ලටම නිසි පරිදි පිළිතුරු ලබා දී ඇත.

# 4 කාර්ය සාධන දර්ශක

## 4.1 රජයේ වියදම් දැරීම සම්බන්ධයෙන් 2020 වර්ෂයේ නිකුත් කළ චක්‍රලේඛ

2020 වර්ෂය ආරම්භයේ සිට මතු වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වූ අතර එම වසංගත තත්ත්වය පාලනය සහ ඒ හේතුවෙන් පීඩාවට පත් වූවන්ගේ සුබ සාධනය සැලසීම ප්‍රමුඛ කාර්යයක් විය. ඒ හේතුවෙන් රාජ්‍ය වියදම් කළමනාකරණය හා මූල්‍ය විනය දැඩිව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වූ අතර 2019 වර්ෂයේ දී රාජ්‍ය වියදම් දැරීම කළමනාකරණය කිරීමට නිකුත් කළ චක්‍රලේඛයන් තුළින් හඳුන්වා දුන් වියදම් පාලන ක්‍රමවේද 2020 වර්ෂයේ ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

තවද 2020 වර්ෂයට අදාළ විසර්ජන පනත සම්මත වන තුරු කාලය දක්වා අතුරු සම්මත ගිණුම් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාව යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබාදුන් අධිකාරී බලපත්‍ර යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඉහත අවස්ථාවන් හිදී වෙන් කළ ප්‍රතිපාදන යටතේ සහ 2020 වර්ෂයට අදාළ විසර්ජන පනත මඟින් වෙන් කළ ප්‍රතිපාදන යටතේ වියදම් දැරීම සඳහා බලය දීම වෙනුවෙන් චක්‍රලේඛ නිකුත් කරන ලදී. තවද, 2021 වර්ෂයේ අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් ද අකර්මන්‍ය වූ කෘෂි නිෂ්පාදන අලෙවිය සක්‍රීය කිරීමට අදාළ චක්‍රලේඛයක් ද 2020 වර්ෂයේ දී නිකුත් කරන ලදී.

**රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ**

| චක්‍රලේඛ අංකය | දිනය | විෂයය |
|---|---|---|
| NB/07/2020 | 2020.12.23 | 2021 වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය |
| NB/06/2020 | 2020.11.30 | 2020 අංක 06 දරන විසර්ජන පනත අනුව වියදම් දැරීම සඳහා බලය දීම හා 2020 වර්ෂය සඳහා වියදම් වාර්තාකරණය |
| NB/05/2020 | 2020.09.03 | අයවැය කැඳවීම 2021 (2021-2023 මධ්‍යකාලීන රාමුව තුළ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශය) |
| NB/04/2020 | 2020.08.31 | 2020 අගෝස්තු 28 දින පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද අතුරු සම්මත ගිණුම මගින් අනුමත වී ඇති අයවැය ප්‍රතිපාදන යටතේ වියදම් දැරීම සඳහා බලය |
| NB/03/2020 | 2020.05.31 | 2020 ජුනි 01 සිට අගෝස්තු 31 දක්වා මාස 3 ක කාලය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමේ බලය |
| NB/02/2020 | 2020.05.29 | කොවිඩ් 19 වෛසරය ව්‍යාප්ත වීම වැළැක්වීමට දිවයින පුරා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් ප්‍රාදේශීය/ජාතික මට්ටමින් අකර්මන්‍ය වූ කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ වැඩපිළිවෙල රජය මැදිහත් වී සක්‍රිය කිරීම, |
| NB/01/2020 | 2020.03.10 | 2020 මාර්තු මස සිට 2020 මැයි අවසානය දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමේ බලය |

# 5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතන විසින් ඉටු කළ යුතු කාර්යයන් සඳහා අවශ්‍ය රජයේ මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම හා විසර්ජනය කිරීම වන බැවින් ඉලක්ක 17ක්, අරමුණු 164ක් හා දර්ශක 244ක් සහිත 2030 සඳහා වන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සෘජුවම අදාළ නොවේ. කෙසේවුවද, මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව අනෙකුත් ආයතන වලට අවශ්‍යතිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි බැවින් සියලුම ඉලක්ක දෙපාර්තමේන්තුවට වක්‍රව අදාළ වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික අයවැය මගින් එම ආයතන වෙත අරමුදල් ලබාදීමේ දී තිරසර සංවර්ධන ඉලක්ක, අයවැයකරණ ක්‍රියාවලිය සමග ප්‍රවාහ ගතකිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත.

2019 වසර අවසානයේ දී ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීම මගින් මුල් කාර්තුවේ රජයේ වැය දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගන්නා ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පාර්ලිමේන්තු මැතිවරණය කල්යාමත් සමග 2020 මාර්තු සිට අගෝස්තු අවසානය දක්වා රජයේ වියදම් ඒකාබද්ධ අරමුදලින් දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව සිදුවිය. එහිදී රජයේ සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමට හා කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුහුණ දීම සඳහා අත්‍යවශ්‍ය කටයුතු වලට ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

නව පාර්ලිමේන්තුව රැස්වීමෙන් පසු 2020 වර්ෂය සඳහා විසර්ජන පනතක් ඉදිරිපත් කරන තෙක් 2020 සැප්තැම්බර් 01 සිට ඒකාබද්ධ අරමුදලින් වියදම් දැරීමට අතුරු සම්මත ගිණුමක් මගින් ප්‍රතිපාදන වෙන්කරන ලදී. මෙවැනි තත්ත්වයන් යටතේ වුවද තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට 2020 වර්ෂය ආරම්භයේ පැවැති ව්‍යාපෘතින් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ඒ ඒ වැය ශීර්ෂයන්ට අදාළව වෙන්කරන ලදී.

කෙසේ වෙතත්, 2021 අයවැය මගින් ඒ ඒ ආයතන විසින් සිදුකරන ප්‍රධාන ව්‍යාපෘති කවර තිරසර සංවර්ධන අරමුණුවලට සම්බන්ධ ද යන්න දක්වා ඇත. එසේම තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ ඉලක්ක ඉටුකරගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර ඇත.

උදා - 2021 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘති නාමය | මුළු පිරිවැය ඇස්තමේන්තුව :(රු.මිලියන) | ව්‍යාපෘති කාලසීමාව | මූල්‍ය ප්‍රභවය | 2020 සමුච්චිත වියදම 2020..08.31 (රු.මිලියන) | 2021 ප්‍රතිපාදන (රු.මිලියන ) | 2021 ඉලක්ක | ප්‍රධාන කාර්ය සාධන දර්ශක | ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්ක |
|---|---|---|---|---|---|---|---|---|
| ගම්මාන සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන | | වාර්ෂික වැඩසටහන් | දේශීය | - | 5,300 | ගම්මන 5,000 ක් ඉලක්ක කරගනිමින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සංවර්ධනය වූ ගම්මාන සංඛ්‍යාව | 1.4 සෑම පුද්ගලයෙකුටම ආර්ථික සම්පත් සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීම |

# 6 මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 39 | 27 | 12 |
| තෘතීයික | 04 | 04 | 0 |
| ද්විතීයික | 68 | 59 | 09 |
| ප්‍රාථමික | 38 | 34 | 04 |

## 6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය

කාර්යය මණ්ඩලයේ හිඟය නිසා රාජකාරී කටයුතු ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුවට දුෂ්කරතාවන් වලට මුහුණ දීමට සිදුවේ.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව මෙහෙයවන අන්තර් ජාතික ප්‍රාදේශීය පිරිවැයකරණය සහ මුදල් යෙදවීම වැඩසටහන | **01** | **දින 03** | **-** | **-** | විදේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| ජයිකා (JICA) නාමයෝජනා ඉල්ලීම (Online KCCP පාඨමාලාව) | **01** | **දින 21** | **-** | - | විදේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| ආයතනික කාර්ය සාධන සංවර්ධන වැඩසටහන | 01 | **දින 01** | - | - | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| මූල්‍ය විශ්ලේෂණ පිළිබඳ පාඨමාලාව | 03 | **දින 04** | - | - | දේශීය | ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ශ්‍රී ලංකා සැලසුම් සේවයේ නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු පාඨමාලාව | 01 | දින 03 | - | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| තොරතුරු ආරක්ෂණ නිලධාරීන් සඳහා වන සැයිබර් ආරක්ෂණ පුහුණුව | 02 | දින 03 | - | - | දේශීය | මධ්‍යම පරිගණක පද්ධතියේ කාර්යාලීය කටයුතු කළමනාකරණය කිරීම සඳහා මෙම දැනුම වැදගත් වේ |
| ශ්‍රී ලංකා තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති හා උපායමාර්ග පිළිබඳ වැඩමුළුව | 01 | දින 03 | - | - | දේශීය | රාජකාරී කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| විශ්‍රාම වැටුප් සැකසීම සම්බන්ධ පාඨමාලාව | **03** | දින 01 | **15,000.00** | - | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ආර්ථික විද්‍යාව 2020 | **02** | අවු 03 | **255,000.00** | - | දේශීය | කාර්යාලීය කටයුතුවලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| නව CIGAS වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහන | **03** | දින 04 | - | **-** | දේශීය | ගිණුම් සකස් කිරීමේ කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| කාර්යාල කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | **01** | දින 05 | **-** | - | දේශීය | කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |
| රියදුරන් සඳහා විද්‍යාත්මක පිරිමැහුම්දායක හා ආරක්ෂිතව රිය පැදවීම පාඨමාලාව | **01** | දින 01 | | | දේශීය | ආරක්ෂිතව රිය පැදවීමේ දී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ |

2020 මාර්තු මාසයේ සිට පැවැති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැළසුම් කළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් බොහෝමයක් නොපැවැත්වීම හේතුවෙන් 2020 වසරේ කාර්යය මණ්ඩල පුහුණු කිරීම් අවම තත්ත්වයක පැවැතුනි.

# 7 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1 පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කර තිබේ** | | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | **අනුකූල වේ** | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | **අනුකූල වේ** | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | - | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | - | | |
| 1.6 | වෙනත් | - | | |
| **2 පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම** | | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලනචක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** | | |

| | | |
|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| **3 මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මු.රෙ. 135)** | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | **අනුකූල වේ** |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | **අනුකූල වේ** |
| 3.4 | 2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | **අනුකූල වේ** |
| **4 වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |

| | | | |
|---|---|---|---|
| **5 විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබේ | **අනුකූල වේ** | |
| **6 අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | **අනුකූල වේ** | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | **අනුකූල වේ** | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** | |
| **7 විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | **අනුකූල වේ** | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2020.06.02 දිනැතිව නිකුත් කරන ලද 2020 වර්ෂය සඳහා විගණන හාකළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම යන ලිපියට අනුව ගෝලීය covid – 19 වසංගතය නිසා රට තුළ ඇති වූ තත්ත්වය හේතුවෙන් කාර්තුවකට එක බැගින් වර්ෂයකට විගණන හාකළමනාකරණ කමිටු රැසවීම් 04 ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.<br>ඒ අනුව 2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 02ක් පවත්වා ඇත |

| | | |
|---|---|---|
| **8 වත්කම් කළමනාකරණය** | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | **අනුකූල වේ** |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | **අනුකූල වේ** |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | **අනුකූල වේ** |
| **9 වාහන කළමනාකරණය** | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | **අනුකූල වේ** |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | **අනුකූල වේ** |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** |

| | | | | |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | **අනුකූල වේ** | | |
| **10 බැංකු ගිණුම් කළමනාකරණය** | | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** | | |
| **11 ප්‍රතිපාදන උපයෝජනය** | | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | **අනුකූල වේ** | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | **අනුකූල වේ** | | |
| **12 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | **අනුකූල වේ** | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක සිදුකර තිබීම | **අනුකූල වේ** | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | **අනුකූල නොවේ** | - | - |
| **13 පොදු තැන්පත් ගිණුම** | | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | **අනුකූල වේ** | | |

| | | |
|---|---|---|
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| **14 අග්‍රිම ගිණුම** | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | **අනුකූල වේ** |
| 14.2 | මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | **අනුකූල වේ** |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | **අනුකූල වේ** |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | **අනුකූල වේ** |
| **15 ආදායම් ගිණුම** | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | - |
| **16 මානව සම්පත් කළමනාකරණය** | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | **අනුකූල වේ** |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/ 2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| **17 මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | **අනුකූල වේ** |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | **අනුකූල වේ** |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | **අනුකූල වේ** |
| **18 පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | |
| 18.1 | අංක 05/ 2008 හා 05/ 2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | **අනුකූල වේ** |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | **අනුකූල වේ** |
| **19 මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම | **අනුකූල වේ** |

| | | |
|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | **අනුකූල වේ** |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | **මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ටඅනුකූල වේ** |
| 19.4 | ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | **අනුකූල වේ** |
| **20 විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | **අනුකූල වේ** |

# 8 ඇමුණුම - I

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TRE/A/NBD/02/20/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2021 ජූනි 22 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 22 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(i) වැය විෂයය අංක 2108 - කල්බදු වාහන සඳහා ලබාගත් ණය මුදල ආපසු ගෙවීම යටතේ ඇස්තමේන්තු කල වියදම හා සත්‍ය වියදම අතර රු. 10,775,354 ක විචලතාවයක් විය. 2014 අයවැය යෝජනා යටතේ ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි ආනයනය කිරීමේදී බදුවලින් නිදහස් කර තිබුණද, සැපයුම්කාර සමාගම ඒ වනවිටත් නිෂ්පාදන බදු ගෙවා ආනයනය කර තිබූ යතුරුපැදි 2000 ක් ලබාගෙන බෙදාදීමට කටයුතු කර තිබුණි. එම යතුරුපැදි 2000 ට අදාළ රු. 109,612,000 ක් වූ නිෂ්පාදන බදු මුදල්වලින් රු. 12,505,974 ක් 2020 දෙසැම්බර් 31 දින එනම් වර්ෂ 05 කට පසු කල්බදු වාහන සඳහා ලබාගත් ණයමුදල් ආපසු ගෙවීම සඳහා වූ ඉහත වැය විෂයය යටතේ දරා තිබීම මෙම විචලනය සඳහා හේතු වී ඇති බව නිරීක්ෂණය විය. ඉතිරි බදු මුදල් ඉදිරියේදී ගෙවීමට සිදුවිය හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ii) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී වැය විෂයයන් 08 ක විචලතාවය සියයට 88 ක අඩුවීමේ සිට සියයට 64 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබූ බව නිරීක්ෂණය විය.

2.2 බැංකු ගිණුම් මෙහෙයවීම

(i) දෙපාර්තමේන්තුව විසින් චෙක්පත් නිකුත් කිරීමේදී ඒවායේ දින නැවත නැවත දීර්ඝ කරමින් දිගුකාලයක් බැංකු සැසඳුම්වල පවත්වා ගෙන ගොස් තිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල චෙක්පත් තුනක මාස 06 ක කාලය ඉක්මවා තිබියදී මු.රෙ 396 (ඈ) අනුව කටයුතු නොකරමින් දින දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය විය.

2.3 වත්කම් කළමනාකරණය

(i) අයවැය දෙපාර්තමේන්තුවේ අංක 150 දරණ චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් රාජ්‍ය ආයතන වෙනුවෙන් මූල්‍ය කල්බදු යටතේ මිලදී ගන්නා ලද එකතුව රු. 2,824,733,981 ක් වූ වාහනවල කල්බදු කාලය සමාලෝචිත වර්ෂයෙන් අවසාන වී ඇතත් ඒවා අදාළ ආයතනවලට පවරා දීමට කටයුතු කර නොතිබුණි.

4

(ii) අංක 2/2014 හා 2014 ජූලි 23 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව, ක්ෂේත්‍ර නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි වල ලියාපදිංචි අයිතිය වසර 5ක කාලයකට පසුව පුද්ගලික නමට පැවරෙන නමුත් මහා භාණ්ඩාගාරය විසින් රු. 16,792,961,055 ක් වටිනා යතුරුපැදිවල එම කාලය අවසන් වී තිබුණද ඒවා නිසිලෙස පවරා දීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 තැන්පත් ගිණුම්

2020 දෙසැම්බර් 31 දින වනවිට රු. 10,867,222 මුදලක් තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීමට තාවකාලිකව රඳවාගන්නා ලද පොදු තැන්පතු ගිණුම තුළ රඳවා ගෙන තිබුණි. මෙම තැන්පතු ක්ෂේත්‍ර නිලධාරීන් එම තනතුරුවලින් ඉවත්වීමේදී දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ශේෂ වටිනාකම් වූ අතර එම මුදල් ලද විගස අදාළ කල්බදු සමාගමට ගෙවා බැරකම් නිරවුල් කිරීම තුළින් ඊට අදාළ කල්බදු පොළිය අඩු කරගැනීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

(අ) 2001 පෙබරවාරි 16 දින මියගොස් තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.102,497.60 වූ ණය ශේෂය වසර 20 කට අධික කාල සීමාවක සිට දෙපාර්තමේන්තුවේ පොත්වල පවතී. මේ සම්බන්ධව පසුගිය විගණන විමසුම් තුළින් දිගින් දිගටම පෙන්වා දී තිබුණද මෙතෙක් එම ණය අයකරගැනීමට හෝ ඊට අදාළ ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු 2014 පෙබරවාරි 26 දිනෙන් පසු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) 2000 සැප්තැම්බර් 18 දින මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 101,561.30 ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොමැති බව ගොනු පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) 2015 සැප්තැම්බර් 23 දින සිට රාජකාරී කටයුතු සඳහා වාර්තා නොකිරීම හේතුවෙන් 2015 ඔක්තෝබර් 13 සේවය අතහැරයාමේ නියෝගයක් නිකුත් කර තිබූ නිලධාරියා විසින් 2017 අප්‍රේල් 26 දින ඉදිරිපත් කල අභියාචනාව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිෂ්ප්‍රභා කරමින් ඒ බව 2018 අගෝස්තු 17 දින අයවැය අධ්‍යක්ෂක ජනරාල්ට දන්වා යවා

තිබුණි. එම නිලධාරියාගේ 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයවිය යුතු රු. 150,119 ක් වූ ණය ශේෂය අයකරගැනීමට අප්‍රමාදව කටයුතු කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඇ) 2020 අගෝස්තු 28 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 144,150 ක ආපදා ණය ශේෂය 2020 දෙසැම්බර් 31 වන තෙක් අයකරගැනීමට නොහැකි වී ඇත්තේ 2021 පෙබරවාරි 10 වනවිටත් ඔහුගේ විශ්‍රාම වැටුප සකස් කිරීමට අදාළ ලිපිගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යැවීමට ප්‍රමාද වීම හේතුවෙන් බව නිරීක්ෂණය විය.

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 පෙබරවාරි 26 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම, අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම අවසන් කළයුතු බව දක්වා ඇතත් දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂය අදාලව සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයට අදාලව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව 2021 ජූනි 24 විගණිත දින වන විටත් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C ආකෘතිය) දළ පදනමින් පිළියෙල කල යුතු වුවත් විගණනයට ඉදිරිපත් කල මුදල් ප්‍රවාහ ප්‍රකාශය එසේ පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂය තුළ අත්තිකාරම් අයකර ගැනීම රු .14,383,960 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණේ රු .5,320,469 ක් වීමෙන් රු .9,063,491 කින් මුදල් ගලාඒම අඩුවෙන් දක්වා තිබුණි.

(ii) අත්තිකාරම් ගෙවීම රු.12,826,576 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම රු. 6,394,558 ක් ලෙස දක්වා තිබුණි. මෙ නිසා රු. 6,432,018 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂයක් වේ නම් එම ශේෂය භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ ද එම ශේෂයම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ මුදල් හා මුදල්වලට සමාන දෑ යටතේ පෙන්විය යුතු වුවද , 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය වූ රු .347,871 ක වටිනාකම එසේ දක්වා නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය**

**3.1 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය**

2020 අංක 06 දරණ විසර්ජන පනතේ 06 වන වගන්තිය ප්‍රකාරව 240-2-2 ව්‍යාපෘතිය යටතේ වෙන්කර ඇති පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ අදාළ ආයතන වෙත හදිසි හා අනපේක්ෂිත අවශ්‍යතාවක් ඇතිවූ විට ප්‍රතිපාදන වෙන්කිරීමත්, එසේ වෙන්කරන ලද ප්‍රතිපාදනවල කාර්යක්ෂමතාවය තහවුරු කිරීමත්, කාර්යක්ෂමතාවය අනුව ප්‍රතිපාදන නැවත වෙන්කිරීමත් හෝ මාරුකිරීමත් අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එසේ වුවත්, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ දරන ලද මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා නිකුත් කරන ලද අතිරේක ප්‍රතිපාදනවල උපයෝජනය සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

I. පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන වියදම් සඳහා බලය ලබාදුන් මුළු ප්‍රතිපාදන භාවිතා නොකරමින් රු. 11,997,858,791 ක් එනම් සියයට 38 ක ඉතිරිවීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය අංකය | බලය ලබාදෙන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදන | වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු ප්‍රතිපාදන | ඉතිරිවීම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2-2-0-1702-11 | 31,740,931,000 | 19,743,072,209 | 11,997,858,791 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

II. මූ.රෙ. 75 අනුව අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් මාරුකිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුත්තේ ඉතිරිවීම් අඩුකළ පසු ශේෂය වුවද 2020 වර්ෂය තුළ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පරිපූරක ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදිත, ප්‍රතිපාදන මුළුමනින්ම වියදම් නොකර රු.14,302,830,684 ක් ඉතිරිවී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

III. පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ දරන ලද මූලධන වියදම් සම්බන්ධයෙන් විගණනයේදී පහත කරුණු අනාවරණය විය.

(i) මූලධන වියදම් සඳහා බලය ලබාදුන් මුළු ප්‍රතිපාදන හා වර්ෂය තුළ නිකුත් කරන ලද ප්‍රතිපාදන අතර රු. 3,199,137,385 ක් එනම් සියයට 26 ක ඉතිරිවීමක් නිරීක්ෂණය විය. ඒ තුළ ප්‍රතිපාදිත මුදලින් වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම නිකුත් නොකර තිබූ වටිනාකමේ එකතුව රු. 100,000,000 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂයය අංකය | බලය ලබාදෙන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදන | වර්ෂය තුළදී නිකුත් කරන ලද මුළු ප්‍රතිපාදන | ඉතිරිවීම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2-2-0-2503-14 | 50,000,000 | - | 50,000,000 |
| 2-2-0-2503-15 | 19,000,000 | - | 19,000,000 |
| 2-2-0-2503-16 | 1,000,000 | - | 1,000,000 |
| 2-2-0-2503-17 | 30,000,000 | - | 30,000,000 |
| 2-2-0-2503-11 | 12,404,627,000 | 9,305,488,615 | 3,099,138,385 |
| මුළු එකතුව | | | 3,199,137,385 |

(ii) මූලධන වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණද, එම ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් වියදම් නොකර ඉතිරි වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු. 2,415,269,093 ක් වී තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.2 රජයේ අත්තිකාරම් ගිණුම්

(i) 2020 වර්ෂයට අදාළ විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කෙටුම්පත් කාර්යසාධන වාර්තාවට අනුව 2020 විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් ඒකක 63 ක සීමාවන් සංශෝධනය කර ඇති බව දක්වා තිබූ අතර එම ආයතනවලින් 57 ක් පමණක් සීමාවන් වෙනස් කිරීමට අදාළ නිර්දේශ ලිපි විගණනයට ඉදිරිපත් කර තිබූ අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (40401) සීමාවන් වෙනස් කිරීමට අදාළ තොරතුරු කාර්යසාධන වාර්තාවේ ඇතුළත් නොවිය.

(ii) ආයතන 07 ක් සඳහා සීමාවන් සංශෝධනය කර ඇති බවට කෙටුම්පත් කාර්යසාධන වාර්තාවේ සඳහන් වුවත් එම සංශෝධනයට අදාළ ලබාගත් අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2020 වර්ෂයට අදාළව 2020 අංක 06 දරණ විසර්ජන පනතේ තෙවන උපලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා ඇති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වන සත්‍ය අගයන් හා අදාළ සීමා ඉක්මවීම හෝ ළඟානොවීම භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත ප්‍රකාශ සමඟ පරීක්ෂා කරන ලදී. එහිදී සීමා ළඟානොවීම් අවස්ථා 06 ක් හා අනුමත සීමාවන් ඉක්මවීම් අවස්ථා 05 ක් නිරීක්ෂණය වුවද, ඊට අදාළ සංශෝධනයන් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iv) එසේම 2020 අංක 06 දරණ විසර්ජන පනතේ තෙවන උපලේඛනය මඟින් සලසා ඇති ගබඩා සහ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වන සත්‍ය අගයන් සහ අදාළ සීමා ඉක්මවීම් භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත අනුව පරීක්ෂා කර නමුත් එහිදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ (23202) හා කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවේ (28502) උපරිම සීමාව ඉක්මවා තිබුණද, ඊට අදාළ සංශෝධන සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(v) පහත සඳහන් ආයතනවල රජයේ නිලධාරීනගේ අත්තිකාරම් "බී" ගිණුමට අදාළ අවසාන මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති අගයන් සහ අවසාන භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශවල දක්වා ඇති අගයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| ශීර්ෂ අංකය | දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශය | සීමාව | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගය | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ප්‍රකාශවල දක්වා ඇති අගය | වෙනස |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| 41201 | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | අවම ලැබීම් සීමාව | 13,165,613 | 5,767,253 | 7,398,360 |
| 11501 | බලශක්ති අමාත්‍යාංශය | උපරිම වියදම් සීමාව | 2,484,749 | 12,886,577 | 10,401,828 |
| 33401 | බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය | හර ශේෂ සීමාව | 38,930,766 | 38,931,432 | 666 |
| 42701 | පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | අවම ලැබීම් සීමාව | 10,227,094 | 4,213,051 | 6,014,043 |

(vii) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ (ශීර්ෂ අංක - 288) උපරිම වියදම් සීමාව ඉක්මවා රු. 154,717 වියදම් දරා ඇති අතර එම සීමා ඉක්මවීමට අවශ්‍ය සංශෝධන අවශ්‍ය නොවන බව විගණනයට දන්වා තිබුණි.

(viii) බලශක්ති අමාත්‍යාංශය (ශීර්ෂ අංක - 115) හා කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය (ශීර්ෂ අංක - 419) විසින් ඉල්ලුම් කර තිබූ අවම සීමා ලැබීම් සංශෝධනය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කර තිබුණද උපරිම වියදම් සීමා සංශෝධනය ඉල්ලුම් කර නොමැති බව විගණනයට දන්වා තිබුණි.

(ix) බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය දෙපාර්තමේන්තුව (ශීර්ෂ අංක - 334) සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව (ශීර්ෂ අංක - 269) හර ශේෂ සීමා ඉක්මවීම දක්නට ලැබුණු අතර ඊට අදාළව සීමා සංශෝධන ඉල්ලීමක් ජාතික අයවැය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර නොමැති බව නොමැති බව විගණනයට දන්වා තිබුණි.

(x) වසර ගණනාවක සිට රජයේ අත්තිකාරම් ගිණුම් ශේෂ ආයතන 35 ක නිරවුල් නොවී පැවත එන අතර ඒවායේ එකතුව රු. 1,361,561,464 ක ශුද්ධ වටිනාකමක් විය.

(xi) ඉහත නිරවුල් නොවී පැවතුණු ශේෂයන් අතර ආයතන 09 ක රු. (20,479,126.88) වූ බැර ශේෂයන්ද ඇතුළත් වී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 09 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් ලෙස පුරප්පාඩු 25 ක් පවතින බව එම පුරප්පාඩු හේතුවෙන් රාජකාරී කටයුතු ඉටුකිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදුව ඇති බවත් නිරීක්ෂණය විය.

එස්.එම්.ඩී.එස්.එස් .රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත :- 1) අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
2) ලේකම් - මුදල් අමාත්‍යාංශය

11